**සීමාසහිත පූඩළුඔය විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී - I තනතුර සඳහා සුදුසුකම් ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## (1) සාමාන්‍යාධිකාරී - I

වැ.ප.අ : H.L - 01:01

වැ.ප. : 36000-720X10 - 1080X10 - 1440X10 = 68400/

වයස් සීමාව : 18 - 50

සුදුසුකම් :

අ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී II ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක් /සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වානිජ) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පලපුරුද්දක් තිබීම

හෝ

ආ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම. (රාජ්‍ය පරිපාලනය/ කළමනාකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය/ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ) උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/ වානිජ/ කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වීම

හෝ

ඇ. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය / පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාල විෂයයන් ඇතුලත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වීම/ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමා විසින් පිළියෙල කර ගත් අයදුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර සුදුසුකම් සනාථ කරන ලේඛන වල සහතික කළ ඡායා පිටපත් සමග 2022.11.04 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතු යි. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර **සාමාන්‍යාධිකාරී** - I යනුවෙන් සඳහන් කළ යුතු ය.

**සීමාසහිත පූඩළුඔය විවිධ සේවා සමුපකාර සමිතිය,**
**පහළ කඩ වීදිය, පූඩළුඔය.**

**051-2233206**